# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2240/37 - 2021 අගෝස්තු මස 14 වැනි සෙනසුරාදා - 2021.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 24/51 (iv)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වන, 19 වන සහ 20 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

ප්‍රවාහන අමාත්‍ය.

2021 අගෝස්තු මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2021 අංක 2 දරන මෝටර් වාහන (මෝටර් ට්‍රයිසිකල් උවාරණ භාවිතය) නියෝග යනුවෙන් හඳුන්වනු ලබයි.

2. මෝටර් ට්‍රයිසිකලයකට සවි කිරීමට හෝ රැඳවීමට නියමිත උවාරණ -

   (අ) එහි බර, මානයන් හෝ මූලාකෘතියේ දැක්වෙන සීමාවන් නොඉක්මවිය යුතු ය;

   (ආ) එහි හැඩය, සැලැස්ම හෝ බාහිර පෙනුම වෙනස් නොකළ යුතු ය;

   (ඇ) එය නිෂ්පාදනය කරනු ලැබූ කාර්යය වෙනස් නොකළ යුතු ය;

   (ඈ) එහි සමතුලිතතාවය නොබිඳිය යුතු ය;

   (ඉ) රියැදුරු අසුනේ හෝ මගී අසුනක ආසන සඳහා වන ඉඩ කඩ ඇහිරීම වැඩි නොකළ යුතු ය;



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඊ) වා මුවාවේ (windscreen) දර්ශනය හෝ රියැදුරු මැදිරියේ සහ මගී මැදිරියේ පැති දොරටුවල දර්ශනය අවහිර නොකළ යුතු ය;

(උ) පිටුපස දර්ශන කණ්ණාඩිවල දර්ශනය අවහිර නොකළ යුතු ය;

(ඌ) පරාවර්තන බාහිර ස්වරූපයන් නොතිබිය යුතු ය;

(එ) මාර්ගය හෝ ඒ ආශ්‍රිත ප්‍රදේශය භාවිත කරන තැනැත්තන්ට බාධාවක් විය හැකි හෝ අනතුරක් සිදු විය හැකි තියුණු දාර සහිත උවාරණ පිට පැත්තෙහි භාවිත නොකළ යුතු ය;

3. මෝටර් ට්‍රයිසිකලයකට පහන් ලාම්පු සවි කිරීමේ දී -

(අ) මෝටර් ට්‍රයිසිකලයේ අනන්‍යතාවයට වෙනසක් සිදු කර එය නිෂ්පාදනය කරන ලද්දේ යම් කාර්යයක් සඳහා ද එම කාර්යය වෙනස් කිරීමක් සිදු නොවිය යුතු ය;

(ආ) ප්‍රධාන සහ අවපාත කළ හැකි දර්ශන පහන් සහ දර්ශනයකින් සමන්විත වන ප්‍රධාන ලාම්පු, සුදු හෝ කහ ආලෝකයකින් යුක්ත විය යුතු ය. ලාම්පු වාහනයේ ඉදිරිපස සවි කරනු ලැබිය යුතු අතර පිටත ආලෝකය අඳුරු විටක දී වාහනය ගමන් කරමින් සිටින අවස්ථාවක දී හෝ වාහනය සෙමෙන් ඉදිරියට ගමන් කරන අවස්ථාවක දී දල්වා තැබිය යුතු ය. එකී ලාම්පු වාහනයේ ඉදිරිපස සිට මීටර් 300කට වැඩි දුරක් දක්වා පැහැදිලිව දර්ශනය විය යුතු ය;

(ඇ) අවර පහන් (tail lights) රතු ආලෝකයකින් යුක්ත විය යුතු අතර එම පහන්වල ස්වභාවය විය යුත්තේ එන්ජිම ජ්වලනය වන විට දැල්වීම වේ. පහන් වාහනයේ පිටුපස සවි කරනු ලැබිය යුතු අතර ඒවා වාහනයේ පසුපස සිට මීටර් 200කට වැඩි දුරක් දක්වා පැහැදිලිව දර්ශනය විය යුතු ය; සහ

(ඈ) යම් අතිරේක පහන් සවි කිරීමක් මගින් මෝටර් ට්‍රයිසිකලයක අනන්‍යතාවයට, හැඩයට සහ මානයන්ට බාධාවක් ඇති නොවිය යුතු අතර දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ මාර්ගය භාවිත කරන තැනැත්තන්ට ඉන් හිරිහැරයක් සිදු නොවිය යුතු ය;

4. මෝටර් ට්‍රයිසිකලයේ පැති කණ්ණාඩි, ගැටීමක් සිදුවන අවස්ථාවක දී පහසුවෙන් පසුපසට නැවිය හැකි වන පරිදි යම් ආකාරයකට සවි කරනු ලැබිය යුතු ය.

5. රියැදුරු අසුන අසළින් ම පිටුපසින් සවිකරනු ලබන වැටක, ගැටීමක් සිදුවන අවස්ථාවක දී හානියක් සිදු කළ හැකි තියුණු කෙළවරවල් නොතිබිය යුතු ය.

6. මෝටර් ට්‍රයිසිකලයක ටයර්, මඩ්ගාඩ් සහ රෝද ආවරණය, මාර්ගය භාවිත කරන තැනැත්තන්ට අනතුරක්, බාධාවක් හෝ හිරිහැරයක් ඇති වන පරිදි හෝ ඇති වීමට ඉඩ ඇති පරිදි පිටතට නෙරා එන ලෙස සවි නොකළ යුතු ය.

7. මෝටර් ට්‍රයිසිකලයක බාහිර පෙනුම සඳහා නිශ්චිතව දක්වා ඇති වර්ණය වෙනස් කිරීමක් සඳහා කොමසාරිස් ජනරාල්වරයාගෙන් පූර්ව අනුමැතියක් ලබා ගත යුතු ය. එම වෙනස් කිරීම ලියාපදිංචි සහතිකයේ වෙනස් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයා වෙත වහාම ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය.

8. මේ නියෝගවල-

''මෝටර් ට්‍රයිසිකලය'' යන්නට, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

''උවාරණ'' යන්නට, ලාම්පු, පහන්, පහන් ආවරණ, රෝද, රෝද ආවරණ, රිම්, ටයර්, මඩ්ගාඩ්, මඩ කවර, පැති කණ්ණාඩි, පිටුපස දර්ශන කණ්ණාඩි, දොර කවුළුවෙහි සවිකරන වැස්ම (door visors), වාහනයේ ඉදිරිපසට නෙරා ඇති කොටසෙහි හිරු රැස් ආවරණය වන සේ ඇති වැස්ම (hood visors), සුළං අවක්‍රමකය (wind defelectors), බෆර්, බොඩි කිට්, ස්පොයිලර්, ආසන, පැති කර්ටන්, වෙදර් කවර, ස්ටිකර් ඇතුළත් වේ.

08 - 439

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.